# පාත්ෆයින්ඩර් පදනමේ නියෝජිතයෝ චීන තානාපති හමුවෙති



මිලින්ද බර්නාඩ් සමඟ තානාපති චෙන්ංගේ

පාත්ෆයින්ඩර් පදනමේ නිර්මාතෘ මිලින්ද මොරගොඩ මහතා ඇතුළු නියෝජිත පිරිසක් චීන තානාපති චෙන්ංග් ෂියුආන් මහතා හමුවූ අතර කොවිඩ් -19 වෛරසයේ පැතිරීම හා එරට වැසියන් රෝගය හමුවේ මුහුණ දෙන ආකාරය ගැන තානාපතිවරයා මෙහි දී දීර්ඝ කරුණු දැක්වීමක් කර තිබේ. විපතට පත් පවුල්වලට කනගාටුව පළ කළ පාත්ෆයින්ඩර් පදනමේ නියෝජිතයෝ රෝගීන්ට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කළහ. විපත් මැඩ ධෛර්යයෙන් නැගී සිටින්නට චීන සමූහාණ්ඩුවට ශක්තිය ඇති බවට විශ්වාසය පළ කළහ.

"මිතුරන් අවශ්‍ය, මිතුරන් අවශ්‍යම අවස්ථාවේ දී" බව මෙහිදී ප්‍රකාශ කළ චීන තානාපති ෂියුආන් මහතා ශ්‍රී ලංකාවේ ජනතාවගේ කෘතවේදීත්වය ගැන ස්තුතිය පළකර ඇත. චීන ආණ්ඩුව කොවිඩ් - 19 වෛරසය පාලනය කරනු සඳහා ගෙන ඇති පියවර පැහැදිලි කළ තානාපතිවරයා වුහාන් ප්‍රාන්තය සීල්කර පැතිරවීම නතර කරන ලද අතර ලෝක සෞඛ්‍ය සංවිධානය සමඟ සහයෝගයෙන් ජනතාව දැනුම්වත්කර වැළැක්ම හා වළක්වාගැනීම කෙරෙහි පියවර ගැනීමට සමත් වූ බවද දක්වා ඇත. වයිරස බලපෑම උපරිම මට්ටමට පැමිණ ඇති අතර ඉදිරි දිනවල ක්‍රමානුකූලව රෝගීන් අඩුවනු ඇති බවද මෙහිදී තානාපතිවරයා ප්‍රකාශ කර තිබේ.

ශ්‍රී ලාංකික සිසු සිසුවියන් විශාල ප්‍රමාණයක් චීනයේ වුහාන් ප්‍රාන්තයේ උසස් අධ්‍යාපනය ලබන අතර ඇමරිකාව, ජපානය හා දකුණු කොරියාව හැරුණුවිට මෙරට සිසුන්ට ඉගෙනගැනීම සඳහා වැඩිම පහසුකම් සපයන රට චීනය බව මෙහිදී මිලින්ද මොරගොඩ මහතා පෙන්වා දී ඇත. වයිරසය පැතිරෙන වහා කණ්ඩායම් වශයෙන් ශ්‍රී ලංකාවට එන සංචාරකයන් තාවකාලිකව නතර කිරීමට පියවර ගත් අතර මෑත කාලය තුළ චීන සංචාරකයන් ගේ පැමිණීම තනි රටකින් එන දෙවැනි වැඩිම පිරිස බවට පත්ව තිබුණ බවද ප්‍රකාශ කළ තානාපතිවරයා සංචාරක අංශය සම්බන්ධයෙන් නැවතත් සුපුරුදු රිද්මය වෙනුවෙන් සෑම පියවරක්ම ගත හැකි බව ද ප්‍රකාශ කර තිබේ. පාත්ෆයින්ඩර් පදනමේ සභාපති බර්නාඩ් ගුණතිලක, චීන තානාපති කාර්යාලයේ දේශපාලන අංශ ප්‍රධානී ලූ චොන්ග් මහත්වරුද මෙම අවස්ථාවට සහභාගී වූහ.